# ඡායාරූපලෝකය

## හා රූපඥානය

ලාල් හෑගොඩ

ඡායාරූප ලෝකය හා රූපඥනය ඉදිරියේදී ප්‍රකාශයට පත්කිරීමට අදහස් කරන ග්‍රන්ථයකි. මේ එහි පළමු පරිච්ඡේදයයි

දෘශ්‍යමයලෝකය කැමරාලෝකය ඡායාරූපලෝකය හා රූපඥනය පිළිබඳ විමසීමක්. ඡායාරූප ශිල්පය සැබවින්ම ගැඹුරින් හදුරන්නට බලාපොරොත්තුවන්නන්ට පැහැදිළි ආරම්භයක් සඳහා ලියැවූවකි.

මෙහිදී උදහරණ වශයෙන් දක්වන ඡායාරූප, අන්තර් ජාලයෙන් ලබාගත්, හෑගොඩ සේයා ශිල්ප නිකේතනයේ සිසු, සිසුවියන්ගේ හා මා ගත් ඒවා වෙයි.

අදළ ඡායාරූප සඳහා *theshoolofphotography.org/lokayaroo* වෙත යන්න

## ඡායාරූපයක් යනු කුමක්ද ?

විද්‍යුත් හෝ රසායනික මතුපිටක් මත ලබා ගන්නා රූපය ඡායාරූපයක් යන්න ජනප්‍රිය ව්‍යවහාරය වේ. එය පොත් පත්වලද, විශ්ව කෝෂවලද, ශබ්ද කෝෂවලද අඩංගු වේ. මෙහිදී සිදුව ඇති අතපසු වීම නම් රූපය කාචයක් තුළින් පැමිණිය යුතු බව මඟ හැරයාමයි.

**රූපයක්, කාචයක් තුළින් නොපැමිණියේ නම් ඡායාරූපයක් වන්නේ නැත.**

හිරෝෂිමාවේ පාර අයිනේ තාප්පයක මිනිසෙකුගේ රූපයක් සටහන්ව තිබේ. මේ මිනිසා පරමාණු බෝම්බය පුපුරණ මොහොතේ හරියටම කිව්වොත් 1945 අගෝසතු 6වෙනි දා උදෑසන 8.15ට එම තාප්පය ඉදිරියේ සිටි පුද්ගලයෙකි, මෙය අඳිනු ලැබූ රූපයක් නොවේ. බෝම්බය පුපුරණ විට ඇති වූ පීඩනය හා තාපය නිසා අළුවත් ඉතිරි නොකර මිනිසා අතුරුදහන් විය. තාප්පයේ ඇඳි රූපය ඡායරූපයක් නොවේ. ෆොටෝ කොපි යන්ත්‍රයකට ඔබේ අත තබා එහි පිටපතක් ගන්න. එය ඡායාරූපයක්ද? එක්ස් රේ කැමරාවකට ඔබේ ලය හේත්තු කර ඔබේ හොඳ පපුවේ ඡායාරූපයක් ගත හැක. එයට එක්ස් රේ ඡායාරූපයක් යැයි කියන්නේ නැත. ඡායාරූපයක් වන්නේ කාචයේ ධර්මතාවයන්ට අවනත වෙමින් ඒ තුළින් ගියොත් පමණකි. රූපයක් ඡායාරූපයක් වීමට කාචය අත්‍යාවශ්‍ය වෙයි.

රූපය කාචයක් තුළින් පැමිණ, රසායනික හෝ විද්‍යුත් මතුපිටක් මත තැන්පත් වීමෙන් ඡායාරූපයක් සැදෙයි.

### ඡායාරූපයක් ගැනීම

විසි එක්වන සියවස වන විට, කිසිම ශාක්සරතාවයක් නැති අයෙකුට මනා ආලෝක තත්ත්වයෙන් යුත් පැහැදිලි ඡායා රූපයන් ලබා ගැනීම ඉතා පහසු කටයුත්තක් වී ඇත. මෙයට “පොටෝ ගහනවා” යැයි ද ව්‍යවහාර කරති. කැමරා එතරම් දියුණු තත්ත්වයකට පත්කර තිබේ. ඡායාරූප ගැනීම හා පසුපිරියම යන ප්‍රධාන පියවර දෙකකි. එක බොත්තමක් එබීමෙන් ලබාගත හැකිය.

### ඡායාරූප ශිල්පය

ඡායාරූප ශිල්පය ඡායාරූප ගැනීම හා පසුපිරියම යන ප්‍රධාන කොටස් දෙකකින් යුක්ත වේ. කැමරා කාචයේත්, කැමරා ෂටරයේත්, ශිල්පියාගේ අභිමතය අනුව කැමරාවේ වෙනස්කළ හැකි වෙනත් ගුණාංග පාලනය කරමින් සිත්ගන්නා ඡායාරූපයක් නිර්මාණය කිරීම ඡායාරූප ශිල්පය මඟින් සිදු කෙරේ.

## විවිධ ඡායාරූප වර්ග

‘ෆෝකල්’ විශ්ව කෝෂයේ දක්වා ඇති පරිදි ඡායාරූප වර්ග සිය ගණනකි. මේ වර්ග කිරීම් කර ඇත්තේ ඡායාරූප ගත කර ඇති වස්තූන් පදනම් කරගෙනය.

උදහරණ - වනජීවී, මංගල, ක්‍රීඩා, විලාසිතා, ප්‍රවෘත්ති ලෙසය.

# ඡායාරූප ශිල්පයේ මව් වර්ග කිරීම

විශ්ව කෝෂයෙන් නාමික සියලු වර්ග කිරීම් ද අඩංගු වන අප විසින් යෝජිත ප්‍රධාන වර්ග තුනකි. ඒවා වර්ග කර ඇත්තේ ඡායාරූප ගැනීමේ හෝ නිර්මාණයකිරීමේ පරමාර්ථය අනුවය. ඒවා

1. වාර්තා ඡායාරූප - ඡායාරූප *theshoolofphotography.org/lokayaroo* A1-A9 දක්වා
2. නිර්මාණාත්මක ඡායා B6-B6 දක්වා
3. කලාත්මකයයි දැක් වේ. ඡායා C1-C5 දක්වා

සිදුවන සිදුවීම හෝ වස්තුව ඒ ආකාරයෙන්ම සටහන් කර ගැනීම වාර්තා ඡායාරූප වේ.

සිදුවන සිදුවීම හෝ වස්තුව චමත්කාර ලෙස මිනිස් ඇසින් අත්විඳිය නොහැකි සිදුවන සිදුවීම හෝ වස්තුව චමත්කාර ලෙස නිමාකිරීම නිර්මානාත්මක ඡායාරූප වේ.

කලාත්මක ඡායාරූපය යනු, නිර්මාණාත්මක ඡායාරූපයත් අප අධ්‍යාත්මය අමතන්නේනම් එය කලාත්මක ඡායාරූපනයයි නම් කළ හැක. නරඹන්නාගේ අධ්‍යාත්මය පුද්ගල බද්ද මත බැවින් එය ඉදිරියේදී තවත් දීර්ඝව සාකච්ඡා කරනු ලැබේ.

# ලෝකය

ඡායාරූප ලෝකය සොයාගෙන යන මේ ගමන ආරම්භ විය යුත්තේ ලෝකය හඳුනා ගැනීමෙනි. ලෝකය යනු අපගේ පංචේන්ද්‍රියකට සංවේදීවන අප අවට ඇති 360°ක වපසරියක පැතුරුණු ප්‍රදේශයයි. පංචේන්ද්‍රියන්ගෙන් එකකට හෝ සංවේදී නොවන්නේ නම් එය එම පුද්ගලයාගේ ලෝකයට ඇතුළත් වන්නේ නැත.

පන්චේන්ද්‍රයන්ගෙන් අත් දකින ලෝකය සත්‍යයයි හඳුන්වමු

කැමරා ලෝකය, දෘශ්‍යමය ලෝකයට ආසන්න වශයෙන්ම සමානමුත් ඒ ඇත්තේ සැබෑ ලෝකය දක්වන සත්‍ය නොවේ. එහි ඇත්තේ ඇත්තේ ඡායාරූපමය සත්‍යයකි. සැබෑ ලෝකයේ නැති ඡායාරූපයේ සත්‍යය කැමරා ලෝකය කොටසේදී සාකච්ඡාවට භාජනය කෙරේ.

# දෘශ්‍යමය ලෝකය

ලෝකය තුළ අපේ ඇස් දෙකටම සංවේදී වන්නාවූ වපසරිය දෘශ්‍යමය ලෝකය වෙයි. එය හරස් අතට 180° වන හා සිරස් අතට 165° පමණ වපසරියක පැතිරුණු ප්‍රදේශයකි. පංචේන්ද්‍රියන්ගේ සංවේදීතාවයේ හැකියාවන් හා සීමාවන් අනුව ලෝකය පවතින පරිදිම මිනිස් ඇසේ සීමාවන් හා හැකියාවන් අනුව දෘශ්‍යමය ලෝකය පවතී.

මෙහි පෙනෙන හා නොපෙනෙන යැයි කොටස් දෙකකි. නොපෙනෙන දෙයක් වේ නම් එය කෙසේ දෘශ්‍යමය ලෝකයට අයත් වන්නේ දැයි පැනයකි. නොපෙනෙන්නේ ඇසේ සංවේදීතාවයට හසු නොවන බැවිනි. ඇසට නොපෙනුනත් කැමරාවට පෙනෙන බැවින් පවතින බව පිළිගැනීමට සිදු වේ.

1. පැවතුනද පෙනීමට ආලොකය අවශ්‍යවෙයි.
2. ඉතාමත්ම කුඩා නම් නොපෙනේ. ඡායා G1 - G3 දක්වා
3. ඉතාමත්ම ඈත නම් නොපෙනේ. ඡායා I1 - I2
4. ඉතාමත් වේගයෙන් සෙලවෙන්නේ නම් නොපෙනේ. ඡායා H1
5. වස්තූන් ඇත්තේ ඇස සංවේදී නොවන ආලෝක කිරණ තුළ නම් (පාරජම්බුල, අධෝරක්ත) තුලනම් නොපෙනේ. ඡායා I4 - I6 දක්වා

ඇසට නොපෙනෙන ලෝකය කැමරාවෙන් දැකිය හැකිය

# කැමරාලෝකය

කැමරාවේත්, කාචයේත්, පසු පිරියමේත් සීමාවන්ට හා හැකියාවන්ට අනුව කැමරාකාචයේ දර්ශන කෝණයේ දර්ශනවන වපසරියෙන් දැක, දැකගත හැකි කැමරාලෝකය ලෝකයේ වෙනස් තැනකදී දැකගත නොහැක. ශිල්පීය කුසලතාවයද එක් වූ කළ නිර්මාණාත්මක ඡායාරූප බිහිවන්නේ මෙතැන්හීය.

මෙතැනදී අප පළමුවෙන් විසඳගත්ත යුත්තක් වන්නේ දෘශ්‍යමය ලෝකයෙන් ඡායාරූපයට නගන්නේ මොනවද යන්නය.

පළමුවැන්න අප අවට ඇති ලෝකයෙන් කොටසකි. ඡායා D1 - D3

දෙවැන්න අප අවට ඇති ලෝකයෙන් වෙනස් කරන ලද. ඡායා E1 - E2

(මෙහිදී වෙනස් කිරීම යනු දර්ශන කෝණය තුල පෙනෙන යම් දෙයක් ඉන් ඉවත් කිරීම, එයට එක් කිරීම හෝ නැවත සකස් කිරීම වේ.) ඡායා E3 - E4

තෙවැන්න යමක් සම්පූර්ණයෙන් භෞතිකව සකස් කළ දෙයක් ඡායා E5 - E6

## රූපඥානය

කැමරා ලෝකය පිළිබඳ අධ්‍යනය සඳහා පළමුවෙන් රූපඥනය යන්න වටහාගෙන තිබීම අත්‍යාවශ්‍ය වෙයි. රූපඥනය යනු ඡායාරූපඥනය යන්න කෙටිකර හඳුන්වා දීමකි. හුදු වාර්තා කරනයෙන් ඔබ්බට ගොස්, නිර්මාණාත්මක ඡායාරූප තැනිය හැක්කේ රූපඥනය සහිත ඡායාරූප ශිල්පියාටය.

ඡායාරූපයට නැගූ විට එම වස්තුව හා සිදුවීමත්, ඒවායේ ඡායාරූපයත් අතර පවතින දෘශ්‍යමය වෙනස්කම් හඳුනාගෙන ඒවා සිදු වූයේ කෙසේ දැයි, අවබෝධ කරගෙන, කැමරාව පාලනය කරමින් ඒවා තමන්ට අභිමත පරිදි වෙනස් කර ගැනීම අධ්‍යනය කිරීමෙන් ඔබට ලබාගත හැකි ඥනය රූපඥනය වේ. ද්විමාන, ත්‍රිමාන පරිවර්ථනය හැරෙන්නට අන් සෑම දෘශ්‍යමය ගුණාංගයක්ම ශිල්පියාට පාලනය කළ හැකිය.

### ත්‍රිමානි ද්විමානි පරිවර්ථනය

නිර්මාණාත්මක ඡායාරූපයක් සම්පූර්ණයෙන් ශිල්පියාගේ පරිකල්පන ශක්තිය මත රැඳී තිබේ. මීට පාදක වන කරුණු පිළිබඳ සම්පූර්ණ විස්තරයක් මේ පොතෙහි දෙවන කොටසෙහි පලවේ. කැමරා ලෝකයේ දී පාලනය කළ නොහැක්කේ ත්‍රිමාන, ද්විමාන පරිවර්තනයයි. එය කාචයේ නිසඟ ගතිගුණයකි. ත්‍රිමානද්විමාන පරිවර්තනය වෙනස් කළ නොහැකි වූවත්, දර්ශනයේ වස්තූන් පිහිටා ඇති ආකාරයත්, නැතිනම් පිහිටවූ ආකාරයත් අනුව, කැමරාව නිසි සේ යොමු කිරීමෙන් නිර්මාණශීලී ගුණයත් මතුකර ගත හැකිය.

කැමරාවෙන් වෙනස් කළ හැකි පාලනයන්,

1. ආලෝකය, 2. විශාලනය, 3. රාමු කිරීම, 4. කැමරාව ස්ථානගත කරන තැන, 4. සෙලවීම, 5. ක්ෂේත්‍ර ගැඹුර, 6. යථාදර්ශය, 7. මොහොත අල්ලාගැනීම. 8. පැහැ අන්තරය. 9. ඡායාඇළය Gradation මැදිවර්ණයන්හි අනුක්‍රමය

කැමරාලෝකයේ පාලනයන් පිළිබඳ දීර්ග විස්තරයක් වෙනවෙනම ප්‍රකාශයට පත්කරනු ඇත.

# ඡායාරූප ලෝකය

ඡායාරූප ලෝකය යනු මිනිස් ඇසින් අත් විඳීමට නොහැකි වූ කැමරාලෝකය ද අභිබවා ගිය, කැමරාවෙන් ද, පසුපිරියමෙන් ද, දෘශ්‍යමය ලෝකය වෙනත් කර මැවූ චින්තනමය ලෝකයකි. භෞතික ලෝකයත්, මිනිස් චින්තනයත් එක දෙක මුසු වී මැවෙන්නා වූ ඡායාරූප ලෝකය, ලොව කිසිම තැනකදී අත් දැකිය නොහැකි මානව චිත්තනයේ භෞතිකමය ඉදිරිපත් කිරීමකි. ඡායා K1-K7

**අදාල ඡායාරූප සඳහා ජූනි මස 1 වෙනි ද සිට** *theshoolofphotography.org/lokayaroo* **වෙත යන්න.**

■ sponsored by **designwaves.lk**